**1 වන පිටුවෙන්**

**ඔහොම යං.......**

ඉහිකර තිබුණි. මේ ගොන් කඩිමුඩිකාරයින් කතා කරනවිට මේවා පෙන්නා දිය යුතු ය.

## බාහිර බලපෑම්

බටහිර බලවේගයන් ද මේ සටන ඉදිරියට යත් ම සුපුරුදු පරිදි තප්පුලෑම් පටන්ගෙන ඇත. විශේෂයෙන්ම මානව අයිතිවාසිකම් වල අයිතිය සින්න කරගෙන සිටින **Human Right Watch** කාරයින් වැනි අය ද, තව ඒ ගණයේ විවිධ සංවිධාන සහ පුද්ගලයින් ද මේ යුද්ධය නිසා උතුරේ සිවිල් ජනතාව හිරිහැර වලට භාජනය වී සිටින බවට කලබැගෑනි කරන්න පටන්ගෙන ඇත. කොටින් තවම අල්ලාගෙන සිටින ප්‍රදේශවල උන් කරන දාමරික මිනීමරු ක්‍රියාවල ප්‍රතිපල පවා ආණ්ඩුවේ සහ රජයේ හමුදා-වන්හි වැරදි නිසා සිදුවූ දේ ලෙස ගණන් තබමින් දෝෂාරෝපණ පටන් ගෙන ඇත. එංගලන්තයේ සිටින කොටි ඡන්ද බ්‍රෝකර්ලා විසින් මෙහෙයවනු ලබන ද්‍රවිඩ ජනතාව සිටින ඡන්ද කොට්ඨාශවල ලේබර්, ලිබරල් පක්ෂවල මන්ත්‍රීවරුන් වන කීත් වාස්, සයිමන් හියුස්, ස්ටීවන් ටීම් වැනි මන්ත්‍රීන් ද මෙයට හොට දැමීමට උත්සාහ කරති. අද ආණ්ඩුකරන ලේබර් පක්ෂය ජන අදහස් විචාරණය අනුව **(Opinion Palls)** දේශපාලන පසුබෑමකට පත්ව සිටිති. මේ අය මානව අයිතිවාසිකම් වලට වඩා සිය ආසන වල ආරක්ෂාව පතති. නැතිව අප රටේ ප්‍රශ්න ගැනවත්, මානව හිමිකම් ගැනවත් ඇති කැක්කුමක් නිසා නොවේ. මෙය ඔවුන් පාර්ලිමේන්තුවේ දී කළ කතා විමසිල්ලෙන් කියවන විට මනාව පැහැදිලි වෙයි.

කොටි දිගටම අප මුළු රටේම විවිධ ආකාරයේ බෝම්බ පුපුරවමින්, විශේෂයෙන් සිංහල ප්‍රදේශවල සිවිල් ජනසමාජය තුළ සිය ගණනින් කරන ඝාතන ගැන මුන්ට පෙනෙන්නේ නැත. ඒ ජනතාවට ද නිදහස් ලෙස සිය ජීවිතය ගෙනයාමට ඇති අවම මානුෂික අයිතිය පවා මේ කොටි ව්‍යසනය නිසා නැති බව මුන් සියල්ලටම නොපෙනේ.

මේ මානව හිමිකම් ආදී ප්‍රශ්න අල්ලාගෙන මේ ප්‍රතිගාමී කූට බලවේග මීට ද වඩා අපේ රටට අතපොවන්නට ඉදිරියේ ඉඩ ඇති බව පෙනීයෑම අති භයානකය. මේවා මාර්ගයෙන් කොටින්ගේ පරාජය සඳහා රජය කරන සටන මොට කිරීම උන් හැමගේ යටි අදහස වේ. එසේම පසුගිය මස අපේ පුවත් පතින් අප පෙන්වා දුන් පරිදි 13 වන සංශෝධනය ද උපයෝගී කරගෙන රටේ අඛණ්ඩතාවට විනකරන්නට දරන වෑයම ද එසේම තිබේ. ඉන්දියාව ද මැතක රහපාන භූමිකාව ගැන ද අප විමසිල්මත්ව සිටිය යුතු ය.

ජනතා විරෝධය ගැන ඇති බිය නිසා රජය තරමක් මේ බලපෑම්වලට යට නොවී සිටින බවක් දැනට පෙනෙන්නට ඇත. කොටි වසංගතයෙන් රට මුදවා ගැන්මට අරඹා ඇති මේ ගමන එසේම දිරියෙන් යුතුව ඉදිරියට ගෙන යනු ඇතැයි යන්න දේශප්‍රේමී ජනතාවගේ අළුත් අවුරුදු ප්‍රාර්ථනයයි. අප සාමාන්‍ය බාසාවෙන් කියනවා නම් මුල් පිටුවේ ශීර්ෂයේ ලියා ඇති පරිදි **පරෙස්සමෙන් ඔහොම යං** යයි අපි රජයට කියමු.

**ඔබ සැමට සුබ සිංහල අළුත් අවුරුද්දක් වේවා !**

# දේශපාලන රජ පෙළපතක ඔටුන්න අහිමිවූ කුමාරයා



**ප**සුගිය මාසයේ අභාවප්‍රාප්ත අනුර බණ්ඩාරනායක මහතාගේ සම්පූර්ණ නම අනුර ප්‍රියදර්ශී සොලමන් බණ්ඩාරනායකය. තම පියා, සීයා සහ ඊට පෙර ඒ පරපුරේ සිටි අනෙක් බණ්ඩාර නායකවරුන් මෙන් ඔහු ද සොලමන් කෙනෙකි. අනුර ඉපදෙන විට බණ්ඩාර නායක මහතා අනුරාධපුරයේ සංචාරයක ගොස් සිටියේය. එබැවින් පවුලේ ඉපදුණ එකම පිරිමි දරුවාට අනුර යන නම තබන්නට හේතු වූ බව කියති. එසේම පුතා ඉපදුනායින් පසු තම ඉරණම නොසිතූ අයුරු හොඳ අතට වෙනස් වූ බවක් ද එස්. ඩබ්. ආර්. ඩී. කල්පනා කළේය. සමහර විට එවකට සිටි එක්සත් ජාතික පක්ෂයෙන් අයින් වී ශ්‍රීලංකා නිදහස් පක්ෂය පිහිටුවාගෙන වෙනම පැත්තකින් ඉදිරියට යන්නට බණ්ඩාරනායක මහතා කල්පනා කරන්නට ඇත්තේ ඒ නිසා විය හැකිය. 1956 දී ශ්‍රීලංකාවේ සිදුවූ මහා දේශපාලන පෙරළියේදී ස්ථිරවම දිනන බවට ලකුණු පෙන්නුම් කළ නමුත් මුළු ලංකාව පුරාම විහිදීයන විශාල ජයක් තමාට හිමිවනු ඇතැයි බණ්ඩාරනායක මහතාද මොහොතකට හෝ සිතුවේ නැත. ඉන්දියාවේ නේරුලාගේ පෙළපතද, ශ්‍රීලංකාවේ සේනානායක පෙළපත ද ළඟට, බණ්ඩාරනායක දේශපාලන පෙළපතේ ආරම්භයද එසේ ඇතිවීය.

එස්. ඩබ්. ආර්. ඩී. ට පසු ඔහුගේ බිරිඳ සිරිමාවෝ මැතිනිය අගමැති ලෙසද, ඊට පසු දියණිය චන්ද්‍රිකා අගමැති හා ජනපතිවරිය ලෙසටද ශ්‍රීලංකාවේ පාලනයේ මුදුනේ සිටි නමුත් එකම පුත් හා ඔටුන්න හිමි කුමාරයා වශයෙන් කවදා හෝ ලැබෙනවා ඇතැයි බලාගෙන සිටි රටේ නායකත්වය නම් අනුරට ලැබුණේ නැත. සිය පියාගෙන් උරුම වූ විශ්ෂ්ඨ කථිකත්වය ඔහුට උරුම වී තිබුණද, විපක්ෂනායකකම, කථානායක ධූරය හා විදේශ අමාත්‍යධූරය ආදී තනතුරු ඔහුට ලැබුණ මුත් ඔටුන්න නම් ඔහු අත පොවන පමණට වත් ළං වූයේ නැත. එය ඉරණමට අනුව සිදුවූ දෙයකට වඩා දේශපාලන භූමියේ හරි මං නොදැන සැරිසැරීමේ හේතුවෙන් වූ දෙයක් ලෙස බොහෝ දෙනාට පෙනී ගොස් ඇත.

එහෙත් එක් දෙයක් පැහැදිලිය. එනම් අනුර කිසිවිටක දේශපාලනයේ බලාපොරොත්තු වූ ඉලක්කයට යන්නට අනවශ්‍ය ලෙස තම වට පිටාව සකස්කර ගන්නට හෝ මැරවර බලය යොදා ගන්නට හෝ කල්පනා නොකළේය. ඒ අනුව බලන කල ඔහු කොටියන් ව්‍යාඝ්‍රයන් ඇති දේශපාලන පොරබිමේ අනුර මුවෙකු හෝ හාවෙකු ලෙස කල්පනා කළ හැකිය. ඔහු වංචනිකයෙකු නොවී ය.

අනුර තම මව හා පියාමෙන් තද බල දේශපාලන මතිමතාන්තර හෝ න්‍යායන් අනුගමනය කළ කෙනෙකු නොවේ. ඔහු බොහෝවිට ලිබරල් වාදී අදහස් දැරුවෙකි. ඒ නිසාම වරින්වර පක්ෂය මාරු කරන්න-ටද ඔහුට හැකිවිය. තම පියාගේ පක්ෂය අතහැර ගොස් යූ ඇන්පියට ඇතුල්වේයයි කිසිවෙකු නොසිතූ කාලයක ඔහු පහසුවෙන් ම එසේ කළේ ය. බණ්ඩාර නායක නාමය දිගේ ඔහුට උඩට එන්නට නොහැකිවීමේ තරහ නිසා එසේ කරන්නට ඇතියි බොහෝ දෙන සිතුවත් එයට වඩාත් හේතුව වූයේ ඔහු කිසිම දේශපාලන දර්ශනයක් දැඩිව විස්වාස නොකළ නිසාය. ඔහු වඩාත් හිතේ පහසුව ලැබුවේ වමට වඩා දක්ෂිණාංශයට එක්වීමෙනි.

අනුර බණ්ඩාරනායක මහතා කුඩාකල ඉගෙනුම ලැබුවේ රාජකීය විද්‍යාලයේය. එකල ඔහු පාසැලට එන්නේ අම්මාගේ අතේ එල්ලීය. එකල බොහෝ වාරයන්හි පාසැල ඇරෙන තුරු බණ්ඩාරනායක



***මහින්ද රාජපක්ෂ හා අනුර බණ්ඩාරනායක තරුණ යහළුවන් දෙදෙන හැටේ දශකයේ අග හරියේ රොස්මිඩ් පෙදෙසේ නිවසේ පැවති පිරිතකදී එක ළඟ හිඳ පිරිත් නූල අල්ලාගෙන සිටින අයුරු.***

මැතිනිය එහිම රැඳී සිට ඔහු ආපසු නිවසට කැඳවාගෙන ආවාය. එකල අනුරගේ පන්තියේ සිටි යහළුවන් දෙදෙනෙකු නම් රනිල් වික්‍රමසිංහ සහ දිනේෂ් ගුණවර්ධනය. ඒ පාසැල් යහළුකම ඔවුන් අතර සාමාන්‍ය සහ දේශපාලන ජීවිතය පුරාම වීය.

ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ තරුණ සංවිධානය බාරවූ පසු තරුණයෙකු වූ අනුර තවත් දකුණේ සිටි ශ්‍රීලංකා නිදහස් පක්ෂයට හිතැති රුහුණේ දේශපාලන පවුලක තරුණයෙකු හඳුනා ගත්තේය. ඒ මහින්ද රාජපක්ෂය. ඔවුන් අතර සැබෑ මිත්‍රකමක් ඇතිවීය. වරින්වර දේශපාලන වශයෙන් වෙස්කම් ඇතිවූ මුත් අනුරගේ මරණය දක්වා මහින්ද සමග වූ ඒ හිතවත්කම එසේම අඛණ්ඩව පැවතුණි. බොහේවිට අනුරට තම සොහොයුරිය වන චන්ද්‍රිකා අක්කාගේ බහට අවනත වන්නට සිදුවීය. එහිදී තමා ගත යුත්තේ මිතුරාගේ පැත්තද, සොහොයුරියගේ පැත්තද යනුවෙන් ස්ථිරව සිතන්නට හැකියාවක් ඔහුට තිබුණේ නැත. ගිය දෙසැම්බර් මාසයේදී රජයේ ඇමතිවරයෙකු ලෙස ඉඳගෙනම ඡන්දයක් ගැනීමේදී ඔහු තමා නියෝජනය කරන රජයටම විරුද්ධවගොස් විපක්ෂයේ අසුන් ගත්තේ අක්කාගේ ලණුවක් කෑම නිසායයි බොහෝ දෙනා කියති.

අනුර බණ්ඩාරනායක මහතාට දේපළ හා වස්තු රැස්කිරීමට ආශාවක් නොතිබුණු බව ඔහුගේ හිතවතුන් කියන කරුණු වලින් හා මතුපිටින් පෙනෙන අයුරින්ද වටහාගත හැකිය. තමනට පිය උරුමයෙන් ලැබුණු හොරගොල්ලේ වලව්ව තම බැනාවන විමුක්තිගේ නමට මෑතක ලියුවේ ඒ නිසාය. එසේම ඒ අවට ඔහුට අයත්ව තිබුණු ඉඩම්ද ඒ අවට වෙසෙන ජනතාවට දුන් බවද සැළවිය.

විවාහ නොවී තනිකඩව සිටීම නිසා ඔහු නිදහස් ජීවිතයක් ගත කළද මත්පැනට දැඩිව පුරුදුව සිටි බව සමීප හිතවත්තු දනිති. ප්‍රසිද්ධි බීමත්ව කිසි දිනක හැසිරී නැතත් ඔහු මත්පැන් නිසාම ශරීර සෞඛ්‍යයෙන් පිරිහී ගියේය. අවසාන කාලයේ ඔහුගේ ශරීරය ඔහුටම පාලනය කරගැන්මට නොහැකි තරමට මහතද වැඩිවිය. දියවැඩියාව ආදී නොයෙක් රෝග ඔහු කරා ආවේය. ඔහු ගිය මාසයේ මිය ගිය බව සැබෑ නමුත් දේශපාලන වශයෙන් ඔහු මිය ගියේ ඊට බො-හෝ කලකට පෙරයයි කිසියම් පුවත්පතක ළඟදී ලියා තිබුණි.

බොහෝ පොතපත කියවා ලෝකය ගැනද දේශපාලනය ගැනද මුහුකුරාගිය ඥාණයක් ඔහුට තිබුණද ඒ කිසිවක් අප රටේ යහපතට යොදන්නට ඔහුට නොහැකිවීම සැබෑ අවාසනාවකි.

මේ සියල්ල කෙසේ වෙතත් අනුර බණ්ඩාරනායක මහතා හොඳ හදක් තිබුණු, එසේම මෘදු ගතිපැවතුම් වලින් යුත් අතිශය නිහතමානී දේශපාලකයෙකු ලෙස ශ්‍රීලංකා ජනතාවගේ සිතේ සටහන් වෙනවා ඇත.

♦ ***විස්කම් සෙනෙවිරත්න***
**Sri Lanka**

# ප්‍රංශයේදී අවසන් ගමන් ගිය වෝල්ටර්

**ව**සර 25 කටත් වැඩි කාලයක් ප්‍රංශයේ ජීවත්වෙමින් එහි වෙසෙන බොහෝ ශ්‍රීලාංකික බෞද්ධයන්ගේ අතිශය හිතෛෂියෙකු වූ වෝල්ටර් විජේසිංහ මහතා ගිය මස 9 වෙනි දින සදහටම සමුගත් පුවත ප්‍රංශයේ බොහෝ දෙනාගේ හද සසල කළ කරුණක් වීය.

තුරුණු විය යුරෝපයටම කැප කළ වෝල්ටර් විජේසිංහ මහතා සැබෑ ජාති හිතෛෂියෙකි.

1983 වසරේ ප්‍රංශයේ වෙසෙන එල්ටීටීඊ හිතවාදී දෙමළ කොටස් පැරිස් නගරයේ ගෙනගිය ශ්‍රීලංකා සහ සිංහළ විරෝධී කටයුතු වලදී ඒවාට එරෙහිව දැඩි කැපවීමකින් කටයුතු කරමින් මෙන්ම ප්‍රහාරයට ලක්වූ සිංහලයින්ගේ රැකවරණය සඳහා මහඟු මෙහෙයක් ඉටු කළේය. විදේශගත බොහෝ සිංහලයින් වෙතින් අපේකම ඈත්වෙමින් පවතින



**වෝල්ටර් විජේසිංහ මහතා**

මෙවන් යුගයක වෝල්ටර් වැනි ජාති, දේශමාමකයෙකුගේ සදහටම සමුගැන්ම අප කාටත් ඉමහත් පාඩුවකි.

1984 වසරේදී ප්‍රංශයේ ශ්‍රීලංකා ධම්මචක්ක බෞද්ධ සංගමය ආරම්භකිරීමේදීත්, ප්‍රථම වතාවට ෑපදබළු ෑඉදබබැ ප්‍රදේශයේ විහාරස්ථානයක් ඉදිවූ අවස්ථාවේදීත් මෙතුමන් අතින් විශාල සේවාවක් ඉටුවී ඇත. පසුව එම ආරාමය පැරිස් නුවරට ආසන්නයේ ඕ කදමරුබැඩෑම ප්‍රදේශයට ගෙන ඒමේ සිට එතුමන් මියයන තුරුම එම විහාරයේ ප්‍රධාන දායකයෙකු සේම එහි විහාරාධිපති පූජ්‍ය කෝ. ආනන්ද ස්වාමීන් වහන්සේගේ කැපකරුවෙකු සේ මහත් පරිත්‍යාගයෙන් කා අතරත් හොඳ හිත රැකගනිමින් අකලංක සේවයක් ඉටු කළේය. ප්‍රංශයේ ශ්‍රීලංකා සංස්කෘතික සංවිධානය ආරම්භ වූ තැන් පටන් පවත්වන ලද අවුරුදු උළෙලවල් හා වෙනත් සංස්කෘතික උත්සව ආදියේත්, ප්‍රංශයේ ප්‍රධාන සංඝනායක පූජ්‍ය පරවාහැර චන්ද්‍රරතන හිමියන්ගේ අනුශාසකත්වය යටතේ කෙරෙන සෑම උත්සව අවස්ථාවකදීත්, එසේම පැර-ිස් නගරයේ සිංහලයින් කොතැනද බෞද්ධයින් කොතැනද ඒ සෑම තන්හිම යම් සේවයක් ඉටුකරමින් ගැවසුණු වෝල්ටර් විජේසිංහ මහතාණන් යළි අපට ඒ සේවය ලබාගන්නට ළඟ පාතකවත් නොමැත. එතුමන්ගේ අභාවයෙන් හිස් වූ තැන පුරවන්නට ප්‍රංශයේ අපේ දරුවන්වත් පෙරමුණ ගතහොත් එය එතුමන්ට කරන උපහාරයක් වන්නේය.

වෝල්ටර් විජේසිංහ මහතා අමා මහ නිවනින් සැනසෙත්වා!

♦ ***අමර ගුණසේකර*** **Paris France**